**CORGI Registered Central Heating Engineer**

**Reliable, friendly. Any work not too small.**

කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
*නාමල්* Namal - 0 7 9 5 8 7 2 0 9 1 2

ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි, අදහස් හා දැන්වීම් ඒවා ලියා එවන අයගේය. එබැවින් ඒවා ගැන කර්තෘගේ කිසිදු වගකීමක් නැති බව කරුණාවෙන් සලකන්න.

**මෙම ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් මාස්පතා ඔබේ ගෙදරට ගෙන්වා ගන්නට පවුම් 10 ක චෙක්පතක් කරුණාකර පහත සඳහන් ලිපිනයට එවන්න**

**Lanka Viththi, P.O.Box 14373, London NW6 3WU**

**ලිහිණියා LIHINIYA**

ලන්ඩනයේ ජනප්‍රිය ශ්‍රීලංකා අවන්හල
වසර 10 ක අඛණ්ඩ සේවය
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

**Buffet Daily £5.00 Weekend £6.50**

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප, පිට්ටු, රොටි කොත්තු, බුරියානි, ලම්ප්‍රයිස් හා පරාටා

***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***

Tel. 0208 450 9052 / 0208 208 2658
66 Cricklewood Broadway, London NW2 3EP

**ZOOM VISION VIDEO**

**Broadcast quality wedding video**

- Use of broadcast quality 3 chip digital camera by a qualified videographer.
- Editing with Avid Digital Non-linear system.
- Montage or music video of your choice.
- DVD and VHS copies of the edited master.
- Coverage of Eastern & Western weddings.
- We also cover birthday parties, social functions, other special occasions.



T- 020 8590 6034 Mob. 07859000421

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**

♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

**TRICO**
**Shipping & Forwarding Ltd**

**555 White Hart Lane**
**London N17 7RP**

Telephone 0 2 0 8 8 8 8 8 7 8 7
Fax 0 2 0 8 8 8 9 5 4 4 5
E-Mail : trico@tricoshipping.com

*නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය*



## කෝච්චිය

**කාන්තාව:** මහත්තෙයෝ..... දැන් ඔය එනව ඇහෙන්නෙ මගේ කෝච්චියද?

**දුම්රිය ස්ථානාධිපති:** ඒක ඔහේගෙ වෙන්නෙ කොහොමද? ඒ කෝච්චිය අයිති ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට නේ.....

**කාන්තාව :** මේ විහිළු ඕන නෑ.... කරුණාකර කියන්න මට පුළුවන්ද ඒක ගන්න අඹේපුස්සට යන්න.....?

**දුම්රිය ස්ථානාධිපති:** අපෝ බෑ නෝනා.... කෝච්චියක් කොච්චර බරද?

## මස් ජාතිය

*දිවල් ආහාරයට හෝටලයකට ගිය මිස්ට පෙරේරා කෑම කන ගමන් කෑම ගෙනා වේටර්ට අඩගැසුවේය.*

**මිස්ට පෙරේරා :** ළමයා මේ තියෙන්නෙ හරක් මස් ද? එළු මස් ද?

**වේටර් :** ඇයි මහත්තෙයට කනකොට රසෙන් කියන්න බැරි ද?

**මිස්ට පෙරේරා :** බෑ අයියෙ!

**වේටර් :** එහෙනම් ඉතින් මොන මස් වුනාම මොකද මහත්තෙයො ?

## හොරු ගෙනගිය කාර් එක

**හො**දටම බීමත් මිනිසෙක් පොලීසියට ටෙලිපෝන් කර, හොරු තමාගේ කාර් එක ඇර, එහි තිබූ සියළු දේ අරගෙන ගොස් ඇති

හොඳටම බීමත් මිනිසෙක් පොලීසියට ටෙලිපෝන් කර, හොරු තමාගේ කාර් එක ඇර, එහි තිබූ සියළු දේ අරගෙන ගොස් ඇති බව පැමිණිලි කළේය.

"මගේ කාර් එකේ ඩෑෂ් බෝඩ් එක නෑ... සුක්කානම නෑ... ගලවං ගිහින්.... බ්‍රේක් පෙඩ්ල් එකත් නෑ... කොටින්ම මුං ඇක්සලරේටර් එක පවා අරං ගිහිං රාළහාමි......"

"කොතනද ඔය කාර් එක දැන් තියෙන්නෙ ?" රාළහාමි ඇසීය.

"මේ වීර හෝටලේ ඉස්සරහා......."

"හරි... අපි දැන් එනවා..." කී පොලිස් නිලධාරියා ටෙලිපෝනය කැපීය.

යළිත් තත්පර ගණනකින් ටෙලිපෝනය නාද විය. ඒත් අර කලින් තැනැත්තාමය.

"සමාවෙන්න රාළහාමි... මේ මම ආයි කතාකරන්නෙ.... එන්න එපා.... මට වැරදීමක් වුණේ... බලන කොට මං නැගලා තියෙන්නෙ කාර් එකේ පිටිපස්සෙ සීට් එකට.... අනේ සොරි හොඳෙයි....."

## රස කතා

### ආරක්ෂක තනතුර

*ආරක්ෂක තනතුරකට ඉල්ලුම් කළ සිරිපාල සම්මුඛ පරීක්ෂණයට පැමිණියේය. ඔහු කෙට්ටු ශරීරයකින් යුත් කුඩා පුද්ගලයෙකු විය.*

**කළමනාකරු :** ඔහේගෙ අධ්‍යාපන සුදුසුකම් නම් හොඳයි. ඒත් අපි මේ තනතුර සඳහා හොයන්නෙ බොහොම ප්‍රතාපවත් පෙනුමක් තියෙන, සේවකයෙක් දැක්කම ඇඟට කඩා පනින, සේවකයන්ගෙ කතා බස්වලට හොරෙන් ඇහුම්කන් දෙන, සුළු දේකට වුනත් වහා කිපෙන, සැර පරුෂ කෙනෙක්. ඉතින් ඒ වගේ තනතුරකට ඔහේ සුදුසු නෑ කියලයි මට හිතෙන්නෙ.

**සිරිපාල :** සර් ඔය තනතුරට හොඳට ගැලපෙන කෙනෙක් ඉන්නවා.... මං එයාව එවන්නද...?

**කළමනාකරු :** කවුද ඒ පුද්ගලයා ඔහේ අඳුනන කෙනෙක්ද?

**සිරිපාල :** ඔව් සර් ඒ අපේ පවුල.... එයා නම් මේ තනතුරට හොඳට ගැලපෙනවා.....

*රසකතා අපට ලියා එව්වේ -*
***කෝට්ටේ -***
***නිහාල් චන්ද්‍රසේකර***

Community Legal Service

**ANTONS**
***SOLICITORS***

**Community Legal Service**
**For Quality Services**

We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0**
**Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7**
**Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7**

**ANTONS SOLICITORS**
**14 Wordsworth House, Wordsworth Parade**
**London N8 0SJ**
Tel. 0208 888 6211 Fax 0208 888 1403
***E-mail :*** **antons.solicitors@btopenworld.com**

# Airplane Ride in the Toilet?
# ගුවන්යානයේ වැසිකිලි ආසනයක්

**A** New York man who says he was denied a seat on a five-hour **JetBlue** flight and was instead told to "hang out" in the plane's bathroom has sued the airline for **$2 million**, saying he suffered "**extreme humiliation.**" The man, Gokhan Mutlu arrived to check in for a **JetBlue** flight from San Diego to New York and was told the flight was full, according to the lawsuit filed in New York State Supreme Court.

But Mutlu was allowed to board after a JetBlue flight attendant agreed to give up her seat and travel in an airline employee "jump seat." It was not clear in the lawsuit whether the flight attendant was working. However 90 minutes into the flight, the pilot told Mutlu the flight attendant was uncomfortable and he would have to give up his seat and "hang out" in the bathroom for the remainder of the flight, the lawsuit said.

The pilot " became angry at his reluctance to comply " and said Mutlu " should be grateful for being onboard," the lawsuit said. When Mutlu volunteered to sit in the "jump seat," he was told it was reserved for airline personnel. At one point, the airplane experienced turbulence and Mutlu sat on the toilet seat without a seat belt, causing him " tremendous fear," the lawsuit said.

**JetBlue** was not immediately available for comment. At least if the fear caused him to ' shit himself ' he was in the right place. Seriously though, why would **jetBlue** not try and settle this by giving him free airfare or something. The story is an embarrassment to the company.




**ඇ**මරිකාවේ ප්‍රකට ගුවන්සේවයක් වන ජෙට්බ්ලූ **(jetBlue)** වලට අයත් ගුවන් යානයකින් ගමන්ගත් නිව්යෝර්ක් නගරයේ වැසියෙකුට පුරා පැය 5 ක් ගුවන්යානයේ වැසිකිලියේ ආසනය මත වාඩිවී සිටීමට සිදුවූ නිසා, ඉන් තමාට සිදුවූ මහත් අවමානයට ඔහු ඒ ගුවන් සේවයට එරෙහිව ඩොලර් මිලියන 2 ක වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇත.

ගෝකන් මුට්ලු නමැති ඔහු සැන්දියාගෝ වලින් නිව්යෝක් යාමට ගුවන් යානයට නගිද්දී ආසන නැති බව කිව් පියාසර සේවිකාව ගුවන් යානයේ වෙනත් සේවිකාවකගේ අසුනක් දෙන බව කියා මුට්ලු ඇතුළට ගත්තාය. ඔහු ඒ අසුනේ වාඩිවී යද්දී මිනිත්තු 90 කට පසු ගුවන් යානයේ නියමුවා පැමිණ ආපසු අසුන ඉල්ලා ගෙන ඇත්තේ ඒ අසුන අයිතිකාරයාට නැවත දියයුතු බව කියමිනි. මුට්ලු ඊට විරෝධය පෑ විට ගුවන් නියමුවාට තරහගිය බව ද අනතුරුව ඔහු මුට්ලුට වැසිකිලියේ මළපහකරන ආසනය මත හිඳගන යන ලෙසටද නියමකර ඇත. වෙන කරන් නට දෙයක් නැතිකමට තමා ඊට අවන තව එහි හිඳගෙන ගියබවත්, යානය ගැස්සෙද්දී වැසිකිලියේ ආසන පටියක් නැති නිසා ඉතා බයෙන් ගැහැ ගැහී මුළු කාලයම ගෙවූ බවත් මුට්ලු කියයි.

ජෙට්බ්ලූ ගුවන් සේවය තවම මේ සිද්ධිය ගැන කිසිවක් නොකියයි.

මේ ගුවන් මගියා කලබල නොවී මේ සිද්ධියේ හොඳපැත්ත බැලිය යුතු බව සමහරුන්ගේ මතයයි. එනම් ගුවන් යානය තදින් සෙලවෙද්දී ඔහුට මහත් බයක් දැනුණේ නම් ඉන් ඇතිවන ප්‍රතිපලය පහසුකරවන වඩාත් සුදුසුම තැන ඔහු වාඩිවී සිටි බව ය.